# තාත්තාගේ ආදරය



සරෝජා ධර්මරත්න

# තාත්තාගේ ආදරය

කතෘ

## සරෝජා ධර්මරත්න

කතෘ : සරෝජා ධර්මරත්න
මහාමායා බාලිකා විදුහල
මහනුවර

ISBN No : 978-624-208-137-3
දිනය : 2023/11/15.

# පටුන


1. ගෝලයින් හැඳින්නෙමි
2. පරිසර පාඩම
3. මවුපියන් වෙත ලියමි
4. තාත්තාගේ ආදරය
5. දයාබර දූ පුතුනි
6. ගුරු දේදුන්න
7. පුංචි දරු පැටවුනේ

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 11 01

# ගෝලයින් හැඳින්නෙමි

කොරෝනා හේතුවෙන්
කොටුවෙලා නිවසටම
එකලෙසට ගෙවෙන මේ
දිවියෙ වෙනසක් වෙන්න
මම ගියා හොයාගෙන
මුහුණුපොත

වසර විසිහයක් වූ
ගුරු දිවියෙ මසිත රැඳී
මගේ දරුවන්ම වැනි
ගෝලයින් සොයන්නට
කැළඹුවා
මුහුණු පොත

මැඩම් මම මතකයි ද
මැඩම් මම දන්නව ද
ඇහුවෙ නුඹ ආදරෙන්
කල්පනා කළා මම
බලාගෙන
මුහුණු පොත

සුදු ගවුම් සුදු කමිස
ඇඳලා සිටි ඒ කාලේ
මසිත ඇඳි සිතුවමට
වඩා නුඹ බොහො වෙනස්
පෙන්නුවේ
මුහුණු පොත

ගිහින් නුඹෙ පිටුව වෙත
හඳුනගන්නට නුඹව
බැලුවිට මම දුටුවෙ
සේයාව මගුල් දින
හඳුනගන්නට බැරිය
බැලුවාට
මුහුණු පොත

අතහැරියෙ නැහැ නමුත්

මම ගියා පතුලටම
පොඩිකාලෙ නුඹ සොයන්
නුඹෙ පිටුව පීරමින්
මුහුණු පොත

සොයා ගත්තා මෙමන්
නුඹ හැඳින්නා මෙමන්
ආයෙමත් නුඹ මෙමට
පෙන්නුවේ ආදරෙන්
මුහුණු පොත



# පරිසර පාඩම

හැගත කදන් කහ ගස්
හා ඉගුරු ගස්
කයිරු මුල් තිබෙන ගස්
වැටකෙයියා ගස්
ගත්තා ෆෝන් එක එබුවා
බැලුව ගස්
මොනවා කරන්න ද දැන්
මේ ළමයි පොෂ්

සියොතුන් නගන හඬ
මිහිරියි තුරුගෙ හිස්
ඇප් එක දාගෙනයි ඇහුවේ
නොබල දෙස්
දියකාවාට සර්පයෙකැයි
ලියන ලෙස්
මොනවා කරන්නද දැන්
මේ ලමයි පොෂ්

සුළඟට බීජ විසිරෙන
හොර වරා ගස්
තිබුනත් කොයි තරම්
දෙනෙතේ ගැටෙන ලෙස්
ගුගල් සර්ච් කරලා මිස
බලන ලෙස්
මොනවා කරන්නද දැන්
මේ ළමයි පොෂ්

ගෙනවිත් අතට දුන්නත්
හැකිදෙයක් ගොස්
නොබලයි නොමැත කිසි
විශ්වාසයක් හිස්
ෆෝන් එක තමයි ඔය මුළු
දිවියෙ බොස්
මොනවා කරන්නද ඔය
මොළ ගෙඩිය හිස්



# මව්පියන් වෙත ලියමි

ලොකු හෝටලෙන්
කෑම
තටාකේ ගිලි
නෑම
ගෙන රූප
සැමදාම
සරසනා මුහුණු
පොත
මව්පියන් වෙත
ලියමි

හමා එන මද නලක
විහග ගීයක මිහිර
ඇළ දොළක ඇති සිසිල
විඳිනු දරුවන් සමග





# තාත්තාගේ ආදරය

ඇන්දොතින් කොට ගවුම්
සිනහ කොක් හඬ ලැම්
අනිසි කෙළකවට කම්
හමුවෙ දුටුවේ රැවුම්

යනු ගමන් බෑ යදම්
අසනු බෑ සිත් රිදුම්
නොවේ නිදහසට යම්
කරුනු ගෙන හැර පැම්

තනි නොතනියට බැලුම්
කුස ගින්නෙ නැහැ තැබුම්
මවුට වැඩියෙන් ලැබුම්
හැකියි ඔහුගෙන් ගැනුම්

කල දවස ගෙවී යම්
දිනක බින්දා යදම්
දුන්නු නිදහසට යම්
ලැබුනෙ සතුටය නොනිම්

නොපැවසූ නමුත් යම්
කිසි දිනක නුඹේ පෙම්
දිවි ගමනෙ නොවන නිම්
තිබුණු ආදරෙ විදිම්



# දයාබර දූ පුතුනි


සිකුරාදා හැන්දෑව
වෙනදාට හරි තුටුයි
නුඹලාගෙ දඟ වැඩට
හෙම්බත්ව සතියක්ම

සඳුදාට දකින කොට
පෙර ගැටුම් අමතකයි
මල් කැකුළු මෙන් නුඹේ
කිරි සිනා හරි අගෙයි

-ගුරුතුමිය-



<u>ගුරු දේදුන්න</u>



ගුරු ගැටළු සුදු
එළියකි
එය ප්‍රිස්මයක්
තුළින් නොයවන්න
අපකිරණය වී
ඔබට,
විවිධ වර්ණ
පෙනේවී.
සිදුව ඇත්තේ
ගුරු දේදුන්න
එකතු වී සුදු
ආලෝකය සෑදීමයි
එය බෙදුණු වර්ණ
වලට වඩා
ප්‍රබලය

# පුංචි දරු පැටවුනේ

පිපුනු මල් යාය වන්
පුංචි දරු පැටවුනේ
අවදියෙන් පා තබනු
මේ විෂම ලෝකයේ

දැනුම ඇති සාගරේ
තරම් ඔබ පීවිතේ
කෙරුම දැන ගමන යනු
ජය ලැබෙයි පීවිතේ



# <u>ස්තූතිය</u>

අදින් වසර විසි අටකට පෙර ඇරඹි ගුරු දිවියේ විවිධ දරුවන් සමග ගෙවුනු සුන්දර කාලයේ ලද අත්දැකීම් , තාක්ෂණික ලෝකය තුල දරුවා අතරමං වී ඇති ,සේ පෙනෙන විට දැනෙන කණගාටුව හා වෙනත් ජීවිත අත්දැකීම් අළලා වරින්වර ලියන ලද අදහස් ගොන්නක් එක්කර පොතක් ලෙස එළි කිරීමට අවස්ථාව සැලසූ , සිප්සතර හැදෑරූ මහාමායා විදුමවුනි ඔබටත් ශෂිකලා සේනාධීර වත්මන් විදුහල්පතිනියටත් , නියෝජ්‍ය සහසහකාර විදුහල්පතිනියන්ටත් , හෙවන් පඩිපෙළම නගින වාරයක් පාසා මා පසු පසවිත් ලියමු , ලියමුම කියමින් මා දිරිමත් කළ දිල්රුකා ඇරූගොඩ සහකාර විදුහල්පතිනියටත් ස්තූතිවන්ත වෙමි.

තවදපොත් ලිවීම කෙරෙහි දරුවන් සහ ගුරුවරුන් පෙළ ගස්වන සෙනවිරත්න මහලේකම් ගුරුතුමාත්, පිටු සකස් කිරීමට මා හට සහයෝගය දුන් මාගේ දියණිය මනීෂා සත්සරණීත් ආදරයෙන් සිහිපත් කරමි.

සරෝජා ධර්මරත්න

2023-12-01

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දූරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලිකවඳ යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN No : 978-624-208-137-3